ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

## මහෝපාධ්‍යායයන් වහන්සේ ධුරය සඳහා අයැදුම්පත්‍ර/නාමයෝජනා කැඳවීම

1995 අංක 37 දරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය (සංශෝධන) පනතින් සංශෝධනය කරන ලද 1981 අංක 74 දරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය පනතේ විධිවිධාන අනුව ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයයේ මහෝපාධ්‍යායයන් වහන්සේ වශයෙන් නායකත්වය භාර ගැනීම සඳහා බෞද්ධ/පාලි අධ්‍යයන ක්ෂේත්‍රයේ විශිෂ්ට අන්දමින් සුදුසුකම් ලබා ඇති ධර්මධර, විනයධර භික්ෂූන් වහන්සේලාගෙන් අයැදුම්පත් කැඳවනු ලැබේ. මෙම තනතුරේ නිල කාලය වසර තුනකි. අයැදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයයේ ප්‍රධාන කාර්යාලය හෝමාගම, පිටිපන, මොරගහහේන පාරේ, අංක 37 දරන ස්ථානයේ පිහිටුවා ඇත.

මහෝපාධ්‍යායයන් වහන්සේ පූර්ණකාලීන නිලධරයෙක් වෙති. උන්වහන්සේ විශ්වවිද්‍යාලයයේ ප්‍රධාන විධායක නිලධාරියා හා ගණන් දීමේ නිලධරයා වේ. උන්වහන්සේ නිල බලයෙන් පාලක සභාවේ හා සනාතන සභාවේ සාමාජිකයෙක් ද සභාපති ස්වාමීන් වහන්සේ ද වෙති.

2021.01.04 දිනට වයස අවුරුදු 62ට වඩා නොවැඩි විය යුතුයි. මහෝපාධ්‍යායයන් වහන්සේ කලින් ඉවත් කළහොත් හෝ සේවය අත්හැරියහොත් හැර වසර තුනක කාලයක් සඳහා පත් කරනු ලබන අතර, උන්වහන්සේ වයස අවුරුදු 65 සම්පූර්ණ වනතුරු හෝ මහෝපාධ්‍යාය තනතුරේ කාලය අවසන් වනතුරු හෝ යන දෙකින් පූර්වයෙන් එළඹෙන දිනය තෙක් සේවය කළ යුතු වේ.

මහෝපාධ්‍යායයන් වහන්සේ අධ්‍යයන කටයුතු මෙහෙයවීම, කළමනාකරණ ප්‍රතිපත්ති හඳුන්වාදීම හා පාලක සභාවේ තීරණ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු වෙති. තවද විශ්වවිද්‍යාලයීය සාමාන්‍ය පරිපාලන, අධ්‍යයන විශිෂ්ටත්වය, පාරදෘශ්‍යභාවය, වගකීම, ප්‍රජාතාන්ත්‍රික කළමනාකරණය හා සඵල අපක්ෂපාති නායකත්ව මූලධර්ම අපේක්ෂා කරනු ලැබේ.

ප්‍රබල පර්යේෂණ පැතිකඩක්, ප්‍රත්‍යක්ෂ නායකත්ව ගුණාංග හා විවිධ අභිරුචි කණ්ඩායම් සමඟ ගනුදෙනු කළ හැකි අන්තර් පෞද්ගලික නිපුණතා ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධයෙන් පැහැදිලි අවබෝධයක් හා තීරණ සඵල පරිදි ක්‍රියාත්මක කිරීමේ කැපවීම ඇතුළු උසස් ශාස්ත්‍රාලයීය ජයග්‍රහණ වාර්තාවක් සාර්ථක අපේක්ෂකයා සතුව තිබිය යුතු වේ. ප්‍රජාව කෙරෙහි ප්‍රයාපනය ඇතුළු විශ්වවිද්‍යාලයක ගුණාත්මකභාවය හා මෙහෙවර පිළිබඳ ගැඹුරු අවබෝධයක් උන්වහන්සේ වෙත තිබිය යුතුය. (අයැදුම්පත් හා නාමයෝජනා සඳහා විස්තර www.bpu.ac.lk වෙබ් අඩවියට පිවිසීමෙන් ද ලබා ගත හැක.)

මහෝපාධ්‍යායයන් වහන්සේ විශ්වවිද්‍යාලයේ ඉහළම වැටුප් තලයේ තැබීමට හිමිකම් ලබන අතර, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ. මහෝපාධ්‍යායයන් වහන්සේ සඳහා නිල වාහනයක්, ඉන්ධන දීමනාවක් සහ විශ්වවිද්‍යාලය තුළ නිල නේවාසික පහසුකම් සපයනු ලැබේ.

අයැදුම්පත්‍රය හෝ නාමයෝජනා පත්‍රය සමඟ පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කළ යුතු වේ. අයැදුම්කරුවන්/නාමිකයන් තම දැක්ම පිළිබඳ විස්තරයක් විශ්වවිද්‍යාලයේ පාලක සභාවට ඉදිරිපත් කළ යුතු වේ.

1. උපන් දිනය ඇතුළුව අයැදුම්කරු/නාමිකයාගේ සම්පූර්ණ ජීව දත්ත තොරතුරු

2. අයැදුම්කරු තෝරාගනු ලැබුවහොත් විශ්වවිද්‍යාලයෙහි ඉටුකිරීමට බලාපොරොත්තු වන දැක්ම පිළිබඳ ප්‍රකාශයක්

3. නාමයෝජනාවක් නම්, නාමිකයාගේ කැමැත්ත සහිත ලිපියක්.

4. අයැදුම්කරු/නාමිකයන් රාජ්‍ය සේවය, සමාගමක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක සහ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයයේ හැර වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක සේවයෙහි නියුක්ත වන්නේ නම් අයැදුම්කරු/නාමිකයා තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් උන්වහන්සේ සේවයෙන් නිදහස් කළ හැකි බවට සේවායෝජකයාගෙන් ලිපියක්.

පත් කිරීම් සඳහා විශ්වවිද්‍යාල පනතේ විධිවිධාන අනුව පාලක සභාව විසින් අයැදුම්කරුවන්/නාමිකයන් අතරින් තිදෙනෙක් අනුපිළිවෙළින් තෝරා ගෙන අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලැබේ. තෝරා ගැනීමේ ක්‍රමවේදය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2020 මැයි 04 දිනැති චක්‍රලේඛ අංක 02/2020 අනුව සිදු කරනු ලැබේ.

මීට පෙර 2020.05.13 ඩේලි නිවුස්, 2020.05.14 තිනකරන්, 2020.05.17 සන්ඩේ ඔබ්සවර්, 2020.05.17 ඉරිදා ලංකාදීප සහ 2020.05.18 ලංකාදීප පුවත්පත්වල පළ කරන ලද දැන්වීමට අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛ අංක 02/2020 ප්‍රකාරව අයදුම්පත් ඉදිරිපත් කරන ලද අයැදුම්කරුවන් ද නැවත අයැදුම් කිරීම අවශ්‍ය වේ.

අයැදුම්පත්‍ර හා නාමයෝජනා අදාළ ලේඛන බහාලන ලිපිකවරයේ ඉහළ වම් කෙළවරේ ''මහෝපාධ්‍යායයන් වහන්සේ ධුරය'' යනුවෙන් සඳහන් කළ යුතු වේ.

අයැදුම්පත්‍ර හෝ නාමයෝජනා 2021 ජනවාරි මස 04 දින ප.ව. 4.15ට හෝ ඊට ප්‍රථම ''පාලක සභාවේ ලේකම්, ලේඛකාධිකාරී කාර්යාලය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, අංක 37, මොරගහහේන පාර, පිට්පන නගරය, හෝමාගම'' ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ පෞද්ගලිකව පැමිණ භාර දීම සිදු කළ යුතු වේ.

පියරත්න රණසිංහ ආරච්චි
ලේඛකාධිකාරී හා පාලක සභා ලේකම්
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය.